ßu¿ ´ {ÜlŒL ˆ`ïú
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2015

# සිංහල සාහිත්‍යය හා රසාස්වාදය

**10 ශ්‍රේණිය** **කාලය පැය 3 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **I කොටසෙහි 01, 02 ප්‍රශ්න දෙකටත්, II කොටසෙහි 03 වෙනි ප්‍රශ්නයටත්, III කොටසෙන් තවත් ප්‍රශ්න දෙකකටත් වන සේ ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

## I - කොටස

01 අංක (i) - (v) තෙක් ඇති කොටස් කියවා ඒ එක එකක් පිළිබඳව අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) මා රාජ්‍ය කරමින් සිටිය දී අනපායක් කරන කෙනෙක් නැත්තාහ. කුමක් නිසා මොරගවු ද යි

(අ) මෙසේ පවසන ලද්දේ කවරෙක් ද?

(ආ) එසේ ඇසීමට බලපෑ හේතුව කුමක් ද?

(ii) සර්වාභරණ විභූෂිත වූ එක් මාතුගාමයකු දැක සුභනිමිත්ත ග්‍රහණයෙන් බලා ක්ලේශ වසගව ශාසනයෙහි ඇලුම් නැතිව

(අ) මාතුගාමයකු යනු කවරෙක් ද?

(ආ) ශාසනයෙහි ඇලුම් නැති වූයේ කවරහු ද?

(iii) කොතෙක් වෙහෙස ලදුවත් සුදනෝ පවර
උදක් ලොව සතුන් සිත දුක් කෙරෙති දුර
පසක් රාහු මුව පත් වෙමිනි බිය කර
අනික් පසින් ලොව හෙළි කෙරෙය හිම කර

(අ) සත් පුරුෂයන් ලෝ සතුන්ගේ දුක් නැති කරන බව උපමා කර ඇත්තේ කෙසේද?

(ආ) උදක් යන්නෙහි අර්ථය ලියා දක්වන්න.

(iv) නපුරු කලට සතහට පැමිණෙන වෙහෙස
එදුරු නොවෙයි කළ පව් පල දෙවා මිස
තඹුරු වනය මුකුලිත වන බව සවස
කවුරු විසින් වැළකිය හැකි මෙදිය කුස

(අ) මෙම පද්‍ය උපුටාගෙන ඇත්තේ කුමකින් ද?

(ආ) එහි කතුවරයා කවුද?

(v) (අ) වෙසක් පහන කෙටි කතාව උපුටාගෙන ඇත්තේ කුමකින් ද?

(ආ) එහි කතුවරයා කවරෙක් ද? ( ල . 20)

02 පහත සඳහන් ගද්‍ය හා පද්‍ය කොටස්වල **තද කළු අකුරින් මුද්‍රිත** පදවල අර්ථය පළමුවෙන්ම වෙන් වෙන්ව ලියා එක් එක් පාඨයෙහි සමස්ත අර්ථය ද ලියන්න.

(i) එකල සර්වඥයන් වහන්සේ ''මහණ, තා ශාසනයේ **උකටලී** වූයේ ද'' යි විචාරා වදාරා ''සැබැය ස්වාමීනී'' යි දැන් වූ කල්හි'' මහණද **ක්ලේශ** වසගව නොපවතුව.

(ii) බෝධි සත්වයන්ගේ **අභිප්‍රාය** සිතු පැතු ලෙසම සිද්ධ වන බැවින් ඒ රන්රුව කියා නිමවිය නොහැකි රූපා ශෝභා ඇත්තෝ වීය. එකල මහ බෝධි සත්වයෝ ඒ රන්රුව **සුරත් කොමු පිළියක්** අඳවා ශ්‍රී යහන් ගර්භයෙහි සිටවූ හ.

(iii) ඔක්කාත රජ්ජුරුවෝ ගොස් කුසාවතී නුවර දිව්‍ය පුරයක් මෙන් සරසා **බන්ධනගන** සියලු සත්ත්වයන් මුදා හරවා පුතණුවන්ට ප්‍රභාවතීන් අග මෙහෙසුන් කොට **අභිෂේක** කරවා කුසරජුගේ ආඥාවයයි අණ බෙර ලවා සේසත් නැංවූ හ.

(iv) කුලුණු ගුණින් යුතු උතුමන් සිත **මහරු**

දුදන බසින් නොයෙදෙයි කරනට නපුරු

නව රුවනින් පිරි මහ සමුදුර ගැඹුරු

තණ සුළකින් උණු කළ හැකි වෙති කවුරු

(v) රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි වනතුරු

මිතුරු වේය දිගතින් හමන මඳ මරු

මිතුරු නැසීමට එම වෙයි **පසමිතුරු**

මිතුරු නෑ කෙනෙක් **නිවතුන්** හට කවුරු (ල. 25)

## II - කොටස

● **පහත සඳහන් කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

03 අයියාගේ බැනියමට ගිනි ඇවිලුණු විට නංගීත්, මාත් ආරම්භ කළ ඇඬුම අපි නොනැවැත්වීමු. අයියාගේ අත පිළිස්සී තිබුණ හෙයින් ඔහු දොස්තර ගෙදරට ගෙන යා යුතු යැයි තාත්තා කීවේ ය. අත පිළිස්සීම නිසා අයියා මිය යා හැකැයි මා තුළ බියක් ද, ශෝකයක් ද ඇති විය. පහනට ගිනි ඇවිලුණේ මා අතින් බව සිහිවීම මගේ ශෝකය තවත් වැඩි වීමට හේතු විය. කිරා අපේ බක්කි කරත්තය මිදුලට ගෙනාවේ ය. තාත්තා අයියා කරත්තයේ නංවා දොස්තර ගෙදරට ගෙන ගියේ ය.

පහනට ගිනි ඇවිලුණේ මා අතින් බව අම්මා දත් නමුත් ඈ මට බැණීමට නොසිතුවා ය. අද එසේ නොකළේ බියපත් වී සිටි මා තවත් බිය ගැන්වීම නුසුදුසු යැයි සිතූ හෙනැයි හඟිමි. හඬමින් සිටි නංගී නිශ්ශබ්දව සිටි අම්මාට තුරුළු වී නිඳා ගත්තා ය.

(1) මෙහි සිදුව ඇත්තේ කුමක්දැයි කෙටියෙන් ලියන්න. (ල. 05)

(2) මෙම සිද්ධියෙන් මල්ලී බලවත් ලෙස කම්පාවට පත්ව ඇත්තේ ඇයි ? (ල. 05)

(3) මෙම කොටසින් මව් සෙනෙහස මැනවින් මතු වී පෙනෙන ආකාරය ලියා දක්වන්න. (ල. 05)

(4) මෙම කොටස පිළිබඳ ඇගයීමක් කරන්න. (ල. 10)

## III - කොටස

● **මෙම කොටසේ ප්‍රශ්න දෙකකට පමණක් උත්තර සපයන්න. (එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් හිමි වේ.)**

04 ජාතක කතාකරුවා මිනිසුන්ගේ ශුද්ධ සිතුවිලි දන හැඳින ඒවා පාඨකයා හමුවේ ඉදිරිපත් කර ඇති ආකාරය කුස රජුගේ චරිතය ඇසුරින් විමසුමට ලක් කරන්න.

05 සැබෑ ලෝකයේ කාන්තාවකගේ චිත්ත ස්වභාවය පබාවතියගේ චරිතයෙන් නිරූපනය වෙයි. නිදසුන් තුනක්වත් දෙමින් සාකච්ඡා කරන්න.